**මතුගම අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2019**

**13 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය** II **පත්‍රය** කාලය පැය 03

උපදෙස් : I කොටසින් ප්‍රශ්න 02 කට ද II කොටසින් එක් ප්‍රශ්න යකට ද III කොටසින් ප්‍රශ්න 02 කට ද වශයෙන් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. ( සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමිවේ. )

## I කොටස

01)

I. පහත සඳහන් ස්වර සංගතින් හඳුනාගෙන අදාළ රාග නම් කරන්න. ( ල. 08 )
  a. ගමපධ̲ස් , ධ̲ප , මගරි̲ස
  b. රිග̲රිස , නි̲ධ̣ප̣ , රි
  c. නි̲ධමපධ , මගරිගස , නි̣ස
  d. පනිග්̇රි̇ , ස්̇ග්̇රි̇ස්̇
II. ඉහත රාග අතුරින් a සහ c රාගයන්ට සම ප්‍රකෘති වන රාග 2 නම් කරන්න.(ල.02 )
III. ඉන් a හෝ c රාගයකට අයත් මධ්‍යලය ගීයක ස්ථායි කොටස ගිත ස්වර ප්‍රස්තාර හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර දක්වන්න. ( ල. 06 )
IV. b හෝ d රාගයට ගැලපෙන ස්වර 30 කට නොඅඩු ආලාප කොටසක් නිර්මාණය කරන්න. ( ල. 04 )

02) පහත වගුව ආශ්‍රිතව පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| • ජාතිය පිළිබඳ ප්‍රකාර 3 කි.<br>• පූර්වාංගවාදී වේ.<br>• ඨාඨය කාෆි ය. | • ඖඩව සම්පූර්ණ වේ.<br>• ආරෝහණයේ ග , නි වර්ජිත වේ.<br>• උත්තරාංගවාදී වේ. | • රි ධ කෝමළ වේ.<br>• අති ගාම්භීර වේ.<br>• ධ̲ රි̲ වාදි සංවාදී වේ. | • ඛමාජ් ඨාට වේ.<br>• රි ප වාදි සංවාදී වේ.<br>• සෝරට්, ගෞඩ , බිලාවල් අංග මිශ්‍ර වී ඇත. |

I. ඉහත A , B, C, D රාග හඳුනාගෙන නම් කරන්න. ( ල. 08 )
II. ඉහත රාග අතුරින් සමප්‍රකෘති රාග හඳුනාගෙන ඊට අදාළ සමප්‍රකෘති රාග වල නම් ලියන්න. ( ල. 02 )
III. A හෝ D රාගයන්ගෙන් එකකට අයත් මාත්‍රා 8 තානාලංකාර 2 ක් සහ මාත්‍රා 16 ට වැඩි තිහායි යොදා තවත් තානාලංකාරයක් නිර්මාණය කරන්න. ( ල. 06 )
IV. ඉහත එක් රාගයක සර්ගම් ස්ථායි කොටස ප්‍රස්ථාර කරන්න. ( ල. 04 )

03) පහතින් දැක්වෙනුයේ තබ්ලාවෙන් වැයෙන අක්‍ෂර කිහිපයකි.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කත් | ධා | ධිං | නා | තා | තිං | තු | නා | ගෙ | තිරිකිට | ධි |

I. එම අක්ෂර භාවිතයෙන් ගොඩනැගෙන නිර්දේශිත උතුරු ඉන්දිය තාල 04 ක් නම් කරන්න. ( ල. 04 )

II. ඉන් මාත්‍රා 12 ක තාලයක් තෙගුණ ප්‍රස්තාර කරන්න. ( ල. 04 )

III. මාත්‍රා 16 ක තාලයකට සමාන ලයෙන් වෙනස් විලම්බ ලයට වැයෙන තාලයක් නම් කොට එය ප්‍රස්තාර කරන්න. ( ල. 04 )

IV. දේශීය සංගීතයේ ප්‍රධාන තිත් ප්‍රභේද 3 නම් කර ඊට අයත් උඩරට බෙර පද 3ක් ප්‍රස්තාර කරන්න. ( ල. 06 )

V. මිතියෙන් සහ ලයෙන් සමාන හින්දුස්ථානි තාල යුගල 2 ක් නම් කරන්න. ( ල. 02 )

## II කොටස

04)

I. උත්තර භාරතිය හා දක්ෂිණ භාරතිය සංගීත පද්ධතින් අතර ඇති සම විෂමතා 5 බැගින් පැහැදිලි කරන්න. ( ල. 10 )

II. පහත සඳහන් ගායන ශෛලීන් අතරන් 2ක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. ( ධ්‍රැපද් , ධමාර් , වර්ණම්, තිල්ලානා , තරාණා , චතුරංග ) ( ල. 06 )

III. ඔබ තෝරාගත් ගායන ශෛලියකට අදාළ ගීයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ( ල. 04 )

05) පහත දැක්වෙන මාතෘකා අතරින් 04 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

( උදාහරණ ද ඇත්නම් දක්වන්න. ) ( ල. 05 x 4 = 20 )

I. ගැමි ගී සේ ගී
II. පෙරදිග හා අපරදිග සංගීත පද්ධති
III. සංගීතය පිළිබඳ නිර්වචන
IV. අනාඝාතාත්මක මෙහෙ ගී
V. නුර්ති සංගීතයේ රාගධාරී පසුබිම

III කොටස

06) පහත දැක්වෙනුයේ දේශීය ජන ගී කිහිපයක මුල් ගී පාද අටකි.

- ගම්භිර කාලිංග නුවර
- වෙදා නටන්නේ පළමුව
- ගුණ දැනේ බෝසත් අනේ
- බන්දා මා දේදෝ පියාණෝ
- උත්තමවන් ලොව පතලා
- රත්තරන් පණේ ඔබ එවු පත ලැබුණා
- තේමිය ජාතියේ බෝසත් උපන්නේ
- පැහැසරණිය මිණි පැමිණිය

I. ඉහත ගී පාද අයත් ගායන ශෛලිය හෝ ගී වර්ගය එක් එක් ගී පාදයද සමග පිළිවෙලින් ලියා දක්වන්න. ( ල. 08 )

II. ඉන් භාරතිය ආභාසය ලද ගී ප්‍රභේද 2 නම් කරන්න. ( ල. 02 )

III. නුර්ති සංගිතය හා නාඩගම් සංගිතය පිළිබඳ සංසන්දනාත්මක කරුණු 4 ක් ලියා දක්වන්න. ( ල. 04 )

IV. උඩරට සම්ප්‍රදාය හා පහතරට සම්ප්‍රදායට ආවේණික කරගත් ගිත ප්‍රභේද දෙක පිළිබඳ කරුණු 3 ක සංසන්දනයක් කරන්න. ( ල. 06 )

07)



I. ඉහත බටහිර ස්වර ප්‍රස්තාරය අයත් Time Signature සහ ස්කේලය ලියා දක්වන්න. (ල.02)

II. මෙය පෙරදිග ක්‍රමයට පෙරළා ලියන්න. (ල.04)

III. මෙම ප්‍රස්තාර කොටසට ගැළපෙන ලෙස Chords ලියා දක්වන්න. (ල.04)

IV. පහත දැක්වෙන Chords වලට අයත් ස්වර ලියන්න. (ල.06)

a. C Major $7^{th}$

b. C Augmented

c. G Major

V. ඉහත ප්‍රස්තාර මධ්‍යම භාවයට පෙරළා ලියන්න. (ල.04)

08)

I. වේද ගායනා භාරතිය සංගීතයේ ප්‍රභවයට මුල් වී ඇති අයුරු පහදන්න. (ල.10)

II. මෙරට චිත්‍රපට සඳහා සිංහල සංගීතඥයින්ගේ දායකත්වය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.10)